56467

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේම** සපයන්න.
- **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය ……

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**1.** භාණ්ඩ හා සේවා කිහිපයක් පහත දැක්වේ.

A – පුවත්පත් B – සෞඛ්‍ය සත්කාර
C – රෙදිපිළි D – නීතිමය උපදේශන
E – අධ්‍යාපනය F – එළවළු
G – සමාජ මාධ්‍ය H – රූපවාහිනී

ඉහත දැ අතුරෙන් සේවා පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, D, C, G (2) B, D, E, H (3) B, D, E, G
(4) D, E, G, H (5) D, F, G, H (……)

**2.** නිෂ්පාදන සඳහා භාවිතවන යෙදවුම් කිහිපයක් පහත දැක්වේ.

A – ඉඩම් B – නිපුණතාවය
C – කාර්යමණ්ඩල D – තොරතුරු
E – දැනුම F – ව්‍යවසායකත්වය
G – අමුද්‍රව්‍ය H – තොගය

ඉහත දැ අතුරෙන් අස්පෘශ්‍ය යෙදවුම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, D, E, F (2) B, D, E, F (3) B, D, F, H
(4) C, E, F, G (5) C, F, G, H (……)

**3.** විදේශීය පාර්ශ්වයක් සමඟ බද්ධ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සමාගමක් සතු හැකියාවෙන් පෙන්නුම් කරනුයේ,

(1) තර්ජනයකි. (2) ශක්තියකි. (3) දුර්වලතාවයකි.
(4) අවස්ථාවකි. (5) ශක්තියක් හා තර්ජනයකි. (……)

**4.** 2007 අංක 07 දරන සමාගම් පනත අනුව ශ්‍රී ලංකාවේ සීමාසහිත පෞද්ගලික සමාගමක් පිහිටුවීමට අවශ්‍ය අවම කොටස්කරුවන් සංඛ්‍යාව කොපමණ ද?

(1) 1 (2) 2 (3) 3
(4) 7 (5) 10 (……)

**5.** සමාගමක් විසින් පූර්ණ සැපයුම් දාමය පාලනය කිරීමට යොදාගන්නා ව්‍යාපාරික උපායමාර්ගයක් වන්නේ,

(1) ඉදිරි සංයෝජනයයි. (2) තිරස් සංයෝජනයයි.
(3) සිරස් සංයෝජනයයි. (4) පසු සංයෝජනයයි.
(5) විෂම (Conglomerates) සංයෝජනයයි. (……)

[දෙවැනි පිටුව බලන්න.

Visit EDUHUB

CamScanner

6. පහත වගුවේ ව්‍යාපාරයක පාර්ශ්වකරුවන් කිහිපදෙනෙකු සහ ව්‍යාපාරය කෙරෙහි ඔවුන්ගේ ඇති උනන්දුව දැක්වේ.

| පාර්ශවකරුවන් | උනන්දුව |
|---|---|
| (i) ණයහිමියන් | A - රැකියා ජනනය කිරීම |
| (ii) කොටස්කරුවන් | B - රැකියා සුරක්ෂිතභාවය |
| (iii) රජය | C - මූල්‍ය ස්ථාවරත්වය |
| (iv) පාරිභෝගිකයන් | D - ප්‍රතිලාභ |
| (v) සේවකයන් | E - වටිනාකම |

ඉහත දක්වා ඇති ව්‍යාපාරයක පාර්ශ්වකරුවන් අනුපිළිවෙළ අනුව ඔවුන්ගේ උනන්දුව නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) B, A, D, E, C (2) B, D, A, E, C (3) C, E, A, D, B
(4) C, D, A, E, B (5) D, C, A, E, B (……)

7. පහත වගුවේ රජයේ ආදායම් මූලාශ්‍ර කිහිපයක් හා ඒවා එකතුකරනු ලබන බලයලත් ආයතන දැක්වේ.

| ආදායම් මූලාශ්‍ර | බලයලත් ආයතන |
|---|---|
| (i) වරිපනම් | A - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| (ii) තීරුබදු | B - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| (iii) අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) | C - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව |
| (iv) විමෝචන පරීක්ෂණ ගාස්තු | D - ප්‍රාදේශීය බලධාරීන් |
| (v) වීසා ගාස්තු | E - ශ්‍රී ලංකා රේගුව |

ඉහත දක්වා ඇති ආදායම් මූලාශ්‍ර අනුපිළිවෙළ අනුව ඒවා එකතුකරනු ලබන බලයලත් ආයතන නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, D, C, E, B (2) A, E, B, D, C (3) D, C, B, A, E
(4) D, E, B, A, C (5) E, D, B, A, C (……)

8. පහත දැ අතුරෙන් පරිසර අවස්ථා යථාර්ථයක් බවට පරිවර්තනය කරගැනීමට ව්‍යවසායකයකු සතු විය යුතු ප්‍රධාන ව්‍යවසායකත්ව ලක්ෂණය තෝරන්න.

(1) නායකත්වය (2) නවෝත්පාදනය (3) නොපසුබටබව
(4) ආශාව (5) ස්වයං අභිප්‍රේරණය (……)

9. පහත දැ අතුරෙන් ඒකක භාරයක් රැස් කරගත් අරමුදල් යොදවනු ලබන්නේ,

(1) සමාගම්හි ස්ථාවර වත්කම්වල ය.
(2) සමාගම් සඳහා ණය පහසුකම් සැපයීමට ය.
(3) ජංගම සහ ඉතුරුම් තැන්පතුවල ය.
(4) ආයෝජන කළඹයන්හි ය.
(5) ස්ථාවර පොළියක් සඳහා මූල්‍ය ආයතනවල ය. (……)

10. ව්‍යාපාරවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A – නිශ්චිත වෙළෙඳපොළ අවධානය (Niche)
B – ගෝලීය ක්‍රියාකාරිත්වය
C – වෙළෙඳපොළ ආධිපත්‍යය
D – ස්වයං රැකියා නියුක්තිය
E – විමධ්‍යගත තීරණ ගැනීම
F – අවිධිමත් ව්‍යුහය
G – ස්වාධීනත්වය
H – ප්‍රාග්ධනයට සීමිත ප්‍රවේශය

ඉහත දැ අතුරෙන් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම (MSM) ව්‍යාපාරවල ලක්ෂණ පමණක් අඩංගු නිවැරදි වරණය කුමක් ද?

(1) A, C, D, G, H (2) A, D, F, G, H (3) B, C, E, F, H
(4) B, D, F, G, H (5) C, D, E, F, G (……)

11. ශ්‍රී ලංකා මහ බැංකුවේ තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGSS) යනු,

(1) මාර්ගගත නොවන (Off-line) මුදල් හුවමාරු කිරීමේ පද්ධතියයි.
(2) පරිගණකගත (Electronic) අරමුදල් බෙරුම් කිරීමේ පද්ධතියයි.
(3) ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතියයි.
(4) නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියයි.
(5) නිර්ලේඛන සුරැකුම්පත් තැන්පතු පද්ධතියයි. (……)

[තුන්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

CS CamScanner

**12.** රක්ෂණයේ හානිපූර්ණ මූලධර්මය අදාළ **නොවන්නේ**,
(1) ගොඩනැගිලි රක්ෂණය සඳහා ය. (2) මුහුදු රක්ෂණය සඳහා ය. (3) ගිනි රක්ෂණය සඳහා ය.
(4) මෝටර් රථ රක්ෂණය සඳහා ය. (5) ජීවිත රක්ෂණය සඳහා ය.
(......)

**13.** පහත දැ අතුරෙන් මුද්‍රිත මාධ්‍යයේ ගුණාංගයක් **නොවන්නේ** කුමක් ද?
(1) පුළුල් ආවරණය (2) ප්‍රමාද ප්‍රතිපෝෂණය
(3) යහපත් දෘශ්‍යකරණය (4) පෞද්ගලික අන්තර් ක්‍රියා
(5) භූගෝලීය ව්‍යාප්තිය
(......)

**14.** ප්‍රතිචක්‍රීකරණ අරමුණ සඳහා ගනුදෙනුකරු විසින් භාණ්ඩ නැවත විකුණුම්කරු වෙත යොමු කිරීමේ ක්‍රියාවලිය ඇතුළත් වන්නේ කුමන කාර්යක්‍රම සම්පාදනයට (Logistics) ද?
(1) ආමුඛ (Inbound) (2) ප්‍රතිමුඛ (Outbound)
(3) බෙදාහැරීම (Distribution) (4) ආපසු (Reverse)
(5) තුන්වන පාර්ශ්වීය (Third party)
(......)

**15.** ශ්‍රී ලංකාවේ රුපියලේ අගය ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ විට, ශ්‍රී ලංකාවේ ආනයන සහ අපනයන ප්‍රමාණය කෙරෙහි එය සාමාන්‍යයෙන් බලපාන ආකාරය නිවැරදිව දක්වන වරණය තෝරන්න.

| | ආනයන | අපනයන |
|---|---|---|
| (1) | වැඩි වේ. | අඩු වේ. |
| (2) | වැඩි වේ. | වැඩි වේ. |
| (3) | අඩු වේ. | අඩු වේ. |
| (4) | අඩු වේ. | වැඩි වේ. |
| (5) | වැඩි වේ. | බලපෑමක් නැත. |

(......)

**16.** පහත වගුවේ විවිධ වර්ගයේ නියෝජිතයන් සහ ඔවුන්ගේ භූමිකා දැක්වේ.

| නියෝජිතයන් | භූමිකා |
|---|---|
| (i) කැපකරු නියෝජිතයා | A - ගැනුම්කරු හා විකුණුම්කරු සම්බන්ධ කරයි. |
| (ii) වෙන්දේසිකරු | B - තම නමින් භාණ්ඩ මිලට ගැනීම හෝ විකිණීම සිදු කරයි. |
| (iii) තැරැව්කරු | C - ණයට විකුණන ලද භාණ්ඩ සඳහා අදාළ මුදල් ගෙවීමට එකඟ වෙයි. |
| (iv) කොමිස් නියෝජිතයා | D - ඉහළ ලංසු ඉදිරිපත් කරන්නාට භාණ්ඩයක් විකිණීමට සූදානම් කරයි. |
| (v) සාධකයා | E - තම අභිමතය පරිදි ගැනුම් හා විකුණුම් සිදු කරයි. |

ඉහත දී ඇති නියෝජිතයින් අනුපිළිවෙළ අනුව ඊට අදාළ භූමිකා නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, D, E, C, A (2) C, A, D, B, E (3) C, D, A, E, B
(4) D, C, A, E, B (5) D, C, E, A, B
(......)

**17.** සංවිධානය පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ගොඩනැගීම අභිමුඛ කරගත් කළමනාකරණ උපභූමිකාව කුමක් ද?
(1) නියාමකයා (2) මාධ්‍ය ප්‍රකාශකයා (3) ආයතන ප්‍රධානියා
(4) බාධා පාලනය කරන්නා (5) සම්පත් බෙදාහරින්නා
(......)

**18.** පහත A සහ B ප්‍රකාශ සලකා බලන්න.

**ප්‍රකාශ A** : ව්‍යාපාරයක ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ සම්පත් භාවිතය කාර්යක්ෂම ආකාරයට සිදු කිරීම ය.

**ප්‍රකාශ B** : ව්‍යාපාරයක ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ පාරිභෝගික තෘප්තිය කුමන පිරිවැයක් යටතේ හෝ උපරිම කිරීම ය.


ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,
(1) A පමණක් නිවැරදි වේ.
(2) B පමණක් නිවැරදි වේ.
(3) A හා B දෙකම වැරදි වේ.
(4) A හා B නිවැරදි වන අතර, B මගින් A පැහැදිලි කෙරේ.
(5) A හා B නිවැරදි වන අතර, B මගින් A පැහැදිලි නොකෙරේ.
(......)

[හතරවැනි පිටුව බලන්න.

Visit EDUHUB

CamScanner

**19.** පහත ප්‍රස්තාරය සලකා බලන්න.




ඉහත ප්‍රස්තාරය අනුව, ඇණවුම් කරන ලද තොග ප්‍රමාණය නියමිත වේලාවට නොලැබුනහොත් ආයතනයේ නිෂ්පාදනය අඛණ්ඩව කරගෙන යාම සඳහා උපකාරී වන තොග ප්‍රමාණය ඒකකවලින් කොපමණ ද?

(1) 20 (2) 30 (3) 40 (4) 50 (5) 60 (……)

**20.** භෞතික බෙදාහැරීම් ජාලය හා සම්බන්ධ පාර්ශ්ව කිහිපයක් පහත දැක්වේ.

A – තොග වෙළෙන්දා  B – කර්මාන්තශාලා
C – සිල්ලර වෙළෙන්දා  D – නියෝජිතයා
E – පාරිභෝගිකයා

භෞතික බෙදාහැරීමේ ජාලයක නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

(1) A → B → C → D → E.  (2) A → B → D → C → E.
(3) B → A → D → C → E.  (4) B → D → A → C → E.
(5) C → A → B → D → E. (……)

**21.** භාණ්ඩ කිහිපයක් පහත දැක්වේ.

A – ලී බඩු  B – ජංගම දුරකථනය
C – සඟරාව  D – රන් භාණ්ඩ
E – ශීතකරණය  F – සිසිල් බීම
G – පාන්  H – රූපවාහිනිය

ඉහත දැ අතුරෙන් සාප්පු භාණ්ඩ පමණක් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) A, B, C, G, E  (2) A, B, D, E, H  (3) C, D, G, H, E
(4) C, E, G, H, F  (5) D, E, F, G, H (……)

**22.** ව්‍යාපාරයක අභ්‍යන්තර සහ සෘජු අරමුදල් සම්පාදන මාර්ගයකට උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) රඳවාගත් ලාභ  (2) සාමාන්‍ය කොටස්  (3) සාධ්‍යකරණ
(4) ව්‍යවසායක ප්‍රාග්ධනය  (5) වෙළෙඳ ණය (……)

**23.** පහත දැ අතුරෙන්, ශ්‍රී ලංකා රජය විසින් මෑතකදී ප්‍රතිව්‍යුහගත කරන ලද දේශීය ණය වර්ගය වන්නේ,

(1) වාණිජ පත්‍රිකා ය.  (2) ණයකර ය.  (3) භාණ්ඩාගාර බිල්පත් ය.
(4) භාණ්ඩාගාර බැඳුම්කර ය.  (5) බැංකු ණය ය. (……)

**24.** රැකියාවක් සඳහා සුදුසු අයදුම්කරුවන් සොයාගැනීම, හඳුනාගැනීම හා ආකර්ෂණය කරගැනීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,

(1) තෝරාගැනීම ලෙස ය.  (2) සැලසුම් කිරීම ලෙස ය.
(3) බඳවාගැනීම ලෙස ය.  (4) ස්ථිර කිරීම ලෙස ය.
(5) රඳවාගැනීම ලෙස ය. (……)

**25.** පහත වගුවේ ව්‍යාපාරයක මූල්‍ය තොරතුරු කිහිපයක් දැක්වේ.

| විස්තරය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් |
|---|---|---|---|---|
| ආරම්භක ශේෂය (රු.) | 10 000 | | | ? |
| මුදල් ගලාඒම (රු.) | 30 000 | 40 000 | 40 000 | 50 000 |
| මුදල් ගලායාම (රු.) | 20 000 | 65 000 | 40 000 | 45 000 |

ඉහත තොරතුරු අනුව, අප්‍රේල් මාසයේ ආරම්භක මුදල් ශේෂය කොපමණ ද?

(1) රු. 15 000  (2) රු. 10 000  (3) රු. 5 000
(4) රු. (10 000)  (5) රු. (5 000) (……)

[පස්වැනි පිටුව බලන්න.

Visit EDUHUB
CamScanner

26. පහත වගුවේ සේවක වර්ග සහ ඔවුන්ගේ විස්තර දක්වා ඇත.

| සේවක වර්ග | විස්තර |
|---|---|
| (i) අනියම් | A - නිශ්චිත කාලසීමාවක් නොමැතිව සේවය කරයි. |
| (ii) කොන්ත්‍රාත් | B - පරීක්ෂාව සඳහා කාලසීමාවක් සහිතව සේවය කරයි. |
| (iii) ස්ථිර | C - සීමිත කාලසීමාවක් සඳහා සේවය කරයි. |
| (iv) පරිවාස | D - අවශ්‍යතා පදනම මත සේවය කරයි. |
| (v) තාවකාලික | E - විශේෂිත කාලසීමාවක් සඳහා සේවය කරයි. |

සේවක වර්ග අනුපිළිවෙළ අනුව විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, D, E, B, C
(2) A, E, C, B, D
(3) D, E, A, B, C
(4) D, E, C, B, A
(5) E, D, C, A, B

(......)

27. සේවක රැකියා තෘප්තිය පිළිබිඹු කරන නිවැරදි දර්ශකය තෝරන්න.

(1) උසස්වීම
(2) ඉවත් කිරීම
(3) නවතාලීම
(4) මාරු කිරීම
(5) සේවක ප්‍රවාසිතාවය

(......)

28. මුදල් හා සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A – ස්පර්ශ කළ හැකි වීම
B – ගෝලීය පිළිගැනීම
C – දුරස්ථ ප්‍රවේශ හැකියාව
D – පහළ විභේදන හැකියාව
E – අස්පෘෂ්‍ය බව
F – ඉහළ අවදානම
G – අඩු අවදානම
H – ඉහළ විභේදන හැකියාව

භෞතික මුදල් හා සැසඳීමේදී විද්‍යුත් මුදල්වල දැකිය හැකි ලක්ෂණ පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B, D, E, G
(2) A, C, F, G, H
(3) B, C, E, G, H
(4) B, D, E, G, H
(5) D, C, E, F, G

(......)

29. පහත වගුවේ, මූල්‍ය ප්‍රකාශනවල ඇති යෙදුම් හා ඒවා ගණනය කරන ආකාර දැක්වේ.

| යෙදුම් | ආකාර |
|---|---|
| (i) ශුද්ධ ලාභය | A - ශුද්ධ ලාභය – ආදායම් බදු |
| (ii) විකුණුම් ආදායම | B - විකුණුම් ආදායම – විකුණුම් පිරිවැය |
| (iii) කාලච්ඡේදය සඳහා ලාභය | C - ආරම්භක තොගය + ගැනුම් + ගෙනඒමේ වියදම – (ආපසු යැවුම් + අවසන් තොගය) |
| (iv) දළ ලාභය | D - දළ ලාභය + මෙහෙයුම් ආදායම – මෙහෙයුම් වියදම |
| (v) විකුණුම් පිරිවැය | E - මුදලට විකුණුම් + ණයට විකුණුම් – ආපසු එවුම් |

ඉහත දී ඇති යෙදුම් අනුපිළිවෙළ අනුව ගණනය කරන ආකාර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, D, C, B, E
(2) A, E, D, B, C
(3) D, E, A, B, C
(4) D, E, B, A, C
(5) E, D, A, B, C

(......)

30. පහත දෑ අතුරෙන් ප්‍රාථමික දත්ත මූලාශ්‍රයක් වන්නේ කුමක් ද?

(1) ස්වයං පාලිත සමීක්ෂණ
(2) රාජ්‍ය ආයතන වාර්තා
(3) මහ බැංකු වාර්තා
(4) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා
(5) පුවත්පත් සහ සඟරා

(......)

[හයවැනි පිටුව බලන්න.

Visit EDUHUB

CamScanner

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) බලශක්ති නාස්තිය අඩු කිරීම අවධාරණය කරනුයේ ..................... තිරසරභාවය වන අතර සමානාත්මතාවය අවධාරණය කරනුයේ ..................... තිරසරභාවයයි.

(ආ) නියමකර ඇති අවම වැටුප් ව්‍යාපාරයක් විසින් ගෙවීමට අවනත වීම ..................... වගකීම සඳහා උදාහරණයක් වන අතර නියම කර ඇති අවම වැටුප ඉක්මවා ගෙවීම ව්‍යාපාරයක ..................... වගකීම සඳහා උදාහරණයක් වේ.

**32.** (අ) මූල්‍ය ප්‍රතිපත්තිය, මුදල් සැපයුම හා ..................... කළමනාකරණය කරන අතර පිස්කල් ප්‍රතිපත්තිය, රාජ්‍ය වියදම හා ..................... ආදායම කළමනාකරණය කරයි.

(ආ) ව්‍යාපාරයක මුළු විකුණුම් ආදායම මත අයකරනු ලබන්නේ ..................... බදු වන අතර බැංකුව මගින් පුද්ගලයකුගේ පොලී ආදායම මත අඩුකර ගනු ලබන්නේ ..................... බදු ය.

**33.** (අ) හවුල් ව්‍යාපාර ගිවිසුමක් වාචික, ..................... හෝ ඇගවීමකින් ඇති විය හැකි අතර 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව හවුල්කරුවන් අතර ගිවිසුමක් නොමැති අවස්ථාවකදී ලාභ ..................... බෙදාගත යුතු වේ.

(ආ) ..................... සීමිත සමාගමක් විසින් කොටස් නිකුත් නොකරන අතර එහි මූලික අරමුණ ..................... ඉපයීම නොවේ.

**34.** (අ) පාරිභෝගිකයන්ට ලැයිස්තුගත මිලෙන් අඩු කර භාණ්ඩයක් අලෙවි කිරීමේදී ..................... වට්ටම් දෙනු ලබන අතර ණයගැතියන් කලින් මුදල් ගෙවීමේදී දෙනු ලබන්නේ ..................... වට්ටම් ය.

(ආ) ආයෝජකයින් වෙනුවෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ හා විකිණීමෙහි නිරතවන ආයතන ..................... සමාගම් වන අතර, එම සමාගම් ශ්‍රී ලංකා සුරැකුම් හා ..................... කොමිෂන් සභාවේ ලියාපදිංචි විය යුතු ය.

**35.** (අ) විශාල ප්‍රමාණයකින් කමිස නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය ..................... නිෂ්පාදනයට උදාහරණයක් වන අතර පාරිභෝගිකයකුගේ ඇණවුමකට එක් කමිසයක් මැසීමේ ක්‍රියාවලිය ..................... නිෂ්පාදනයට උදාහරණයක් වේ.

(ආ) පාලන සටහන් ශිල්පීය ක්‍රමය ..................... ක්‍රියාවලි පාලනයේදී භාවිත වන අතර, නිෂ්පාදන ගුණත්වයේ ගැටලු සාකච්ඡා කිරීමට නිතිපතා පවත්වන කණ්ඩායම් රැස්වීම් තත්ත්ව ..................... වලට උදාහරණයක් වේ.

**36.** (අ) පරිගණක ආධාරක නිර්මාණ (CAD) භාණ්ඩයක ..................... අදියරේදී භාවිත කරන අතර පරිගණක ආධාරක නිෂ්පාදන (CAM) භාණ්ඩයක ..................... අදියරේදී භාවිත කෙරේ.

(ආ) උපකරණ හා වැඩ ස්ථාන අනුපිළිවෙළට පිළියෙල කිරීම ..................... පිරියත වන අතර උපකරණ හා යන්ත්‍ර නිෂ්පාදන ස්ථානයට ගෙනඒම ..................... පිරියත වේ.

**37.** (අ) සමාගමක් විසින් විවිධ නිෂ්පාදන සඳහා එක් සන්නමක් භාවිත කිරීම ..................... සන්නම ලෙස ද විවිධ භාණ්ඩ සඳහා විවිධ සන්නම් භාවිත කිරීම .....................සන්නම ලෙස ද හැඳින්වේ.

(ආ) වෙළෙඳපොළක් සමජාතීය කණ්ඩායම්වලට බෙදා වෙන් කිරීම වෙළෙඳපොළ ..................... වන අතර සමාගමක් විසින් කර්මාන්තයේ මුළු විකුණුම්වලින් අත්පත් කරගන්නා ලද ප්‍රතිශතය වෙළෙඳපොළ ..................... වේ.

[හත්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

CamScanner

38. (අ) කල්බදු කාලය අවසානයේදී වත්කම කල්බදු ගැනුම්කරුට මිල දී ගැනීමට ඇති විකල්පය .................... කල්බදු වන අතර කල්බදු කාලය අවසානයේදී කල්බදු ගැනුම්කරු විසින් වත්කම කල්බදු විකුණුම්කරුට ආපසු ලබාදීමට ඇති විකල්පය .................... කල්බදු ලෙස හැඳින්වේ.

(ආ) සමාගමකට ණය මත පොලිය ගෙවීමට ඇති හැකියාව මැනීමට පොලී .................... අනුපාතය භාවිත කරන අතර ආදායම් ජනනය කිරීමට වත්කම් කොතෙක් කාර්යක්ෂමව භාවිත වේ දැයි මැනීමට වත්කම් .................... අනුපාතය භාවිත කෙරේ.

39. (අ) සේවකයින්ගේ වර්තමාන රැකියාව සඳහා අවශ්‍ය වන කුසලතා දියුණු කිරීම .................... තුළින් ද ඔවුන්ට අනාගත වෘත්තීය සඳහා අවශ්‍ය නව කුසලතා දියුණු කිරීම.................... තුළින් ද ඇති කළ හැක.

(ආ) සේවකයින් විසින් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පිහිටුවන සංවිධාන වෘත්තීය .................... අතර සේව්‍යයන් හා සේවකයින් අතර සාකච්ඡා කිරීමේ ක්‍රියාවලිය සාමූහික .................... ලෙස හැඳින්වේ.

40. (අ) නිමැවුම සමඟ වෙනස් නොවන පිරිවැය .................... පිරිවැය ලෙස ද, නිමැවුම සමඟ වෙනස්වන පිරිවැය .................... පිරිවැය ලෙස ද නම් කෙරේ.

(ආ) එකතු කරන ලද සියලුම දත්ත එකවර සැකසීම .................... සැකසුම ලෙස ද දත්ත ලැබෙන අවස්ථාවේදීම ඒවා සැකසීම .................... සැකසුම ලෙස ද හැඳින්වේ.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **සුදුසු පිළිතුරු** දී ඇති හිස්තැන් මත ලියන්න.

41. ව්‍යවසායකත්වය රටකට වැදගත් වන්නේ ඇයි දැයි හේතු **හතරක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

42. පහත සඳහන් එක් එක් උදාහරණ සඳහා වන නිවැරදි ප්‍රවර්ධන මිශ්‍රය ලියන්න.

| උදාහරණය | ප්‍රවර්ධන මිශ්‍රය |
|---|---|
| (1) එකක් මිලට ගෙන එකක් නොමිලේ ලබා ගන්න (BOGOF) | (A) ........................................ |
| (2) විභව පාරිභෝගිකයකු පෞද්ගලිකව මුණගැසීම | (B) ........................................ |
| (3) ක්‍රිකට් තරඟාවලියක් සඳහා අනුග්‍රහය දැක්වීම | (C) ........................................ |
| (4) පුද්ගලාභිමුඛ විද්‍යුත් තැපැල් යැවීම (Campaign) | (D) ........................................ |

43. ව්‍යාපාරයක මූල්‍ය වාර්තා විශ්ලේෂණය කිරීමෙන් කළමනාකරුවකුට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................



Visit EDUHUB

CamScanner

**44.** ශ්‍රී ලංකාවේ ගිවිසුම්ගත ඉතුරුම් ආයතන **හතරක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**45.** සේවක කාර්යසාධනය ඇගයීම තුළින් සේවකයකුට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**46.** පරිගණක පාදක තොරතුරු පද්ධතියක (CBIS) ප්‍රධාන කාර්යන් **හතරක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**47.** ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත කාර්යන් **හතරක්** දක්වන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**48.** පහත දී ඇති තොරතුරු තාක්ෂණය ආශ්‍රිත කෙටි යෙදුම්වල දිගු නාමය ලියන්න.

(1) AI : ..........................................................................................

(2) WWW : ..........................................................................................

(3) LAN : ..........................................................................................

(4) VOIP : ..........................................................................................

**49.** ජාත්‍යන්තර වෙළෙඳාමේදී භාවිතවන ණයවර ලිපිය හා සම්බන්ධවන ප්‍රධාන පාර්ශ්ව **හතරක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**50.** ණය දෙන ආයතනයක් විසින් ණයක් ප්‍රදානය කිරීමට තීරණය කිරීමේදී ව්‍යාපාර සැලසුමක සලකා බලන ප්‍රධාන කරුණු **හතරක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

* * *

Visit EDUHUB

CamScanner

AL/2024/32/S-II

28875

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**
※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** අමන්දා ක්ෂණික ආහාර අලෙවිසැලක හිමිකරු මෙන්ම කළමනාකරු ද වේ. ඇය විසින් මාර්ගගත ක්‍රමය මගින් ඇණවුම් භාරගෙන සෞඛ්‍ය සම්පන්න කාබනික ආහාර අලෙවි කරනු ලැබේ. කෙසේ වුවත්, රටෙහි ඇති වූ ආර්ථික අස්ථායීතාවය, විදේශීය වරලත් ආයතනවලින් ඇති වූ තරගය සහ ප්ලාස්ටික් ඇසුරුම් සඳහා වූ නීතිමය සීමා හේතුවෙන් කාබනික ආහාරවල විකුණුම් පරිමාව අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස සමහර සේවකයින්ගේ සේවය නවතාලීමට ඇය තීරණය කළා ය.

(i) (අ) අමන්දාගේ ව්‍යාපාරය අයත් වන්නේ කුමන නිෂ්පාදන අංශයට ද? ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයේ හිමිකාර-කළමනාකරු ලෙස අමන්දාට ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) අමන්දාගේ ව්‍යාපාරයේ ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) අමන්දාගේ ව්‍යාපාරය ආර්ථිකයේ වර්ධනයට දායක විය හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ඉහත සිද්ධිය ආශ්‍රයෙන් අමන්දාගේ ව්‍යාපාරය කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ආසන්න පරිසර සාධක **දෙකක්** සහ සාර්ව පරිසර සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) අමන්දාගේ ව්‍යාපාරය විසින් සමාජය වෙත ඉටුකළ යුතු සමාජීය වගකීම් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ශ්‍රී ලංකාවේ ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරණය කිරීමේ) නියෝග 2005 අනුව ආහාර ඇසුරුම්වල අනිවාර්යයෙන් සඳහන් කළ යුතු තොරතුරු **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ක්ෂණික ආහාර අලෙවි කරනු ලබන විදේශීය වරලත් ආයතන අමන්දාගේ ව්‍යාපාරයේ තරගකරුවන් ලෙස සැලකිය යුත්තේ ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(v) (අ) සේවකයින්ගේ සේවය නතර කිරීම මෙම ව්‍යාපාරයේ සේවයේ නියුතු සේවකයින්ට බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) අහිමි වූ විකුණුම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අමන්දාට ක්‍රියාත්මක කළ හැකි උපායමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** කලන හා අක්බාර්ගේ නීති උපදේශක විසින් ඔවුන්ගේ කෘෂි ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට ඔවුන්ට උපදෙස් දෙන ලදී. මෑතකදී ඔවුන් හට එකතු කළ අගය සහිත තේ සඳහා ඇණවුමක් ලැබිණි. මෙම ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 5ක අතිරේක ආයෝජනයක් අවශ්‍ය වන හෙයින් ඒ සඳහා ඔවුන් විසින් පහත විකල්ප සලකා බලමින් සිටී:

- නව හවුල්කරුවකු බඳවා ගැනීම
- පෞද්ගලික සීමිත සමාගමක් පිහිටුවීම
- බැංකු ණය මුදලක් ලබා ගැනීම

[දෙවැනි පිටුව බලන්න.

Visit EDUHUB

CamScanner

(i) (අ) කලන සහ අක්බාර් තම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස පිහිටුවීමෙන් ලබාගත හැකි වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) තම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකාවේ 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කිරීමෙන් කලන සහ අක්බාර්ට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) කෘෂි නිෂ්පාදිත සඳහා නිෂ්පාදන පිරිවැය ඉහළ යන්නේ නම්, එය ව්‍යාපාරිකයින් සහ පාරිභෝගිකයින් හට බලපාන්නේ කෙසේ ද? (ලකුණු 02 යි)

(ආ) හවුල් ව්‍යාපාරයකට හවුල් ඔප්පුවක් නොමැති විටක නව හවුල්කරුවකු බඳවා ගැනීමේදී අනුගමනය කළ යුතු ප්‍රධාන පිළිවෙත දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) කලන හා අක්බාර්ට තේ සඳහා අගය එකතු කළ හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) තම කෘෂි නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ප්‍රවර්ධනය කිරීමට කලන හා අක්බාර් හට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් (EDB) ලබාගත හැකි සේවා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) හවුල් ව්‍යාපාරයක් සීමිත පෞද්ගලික සමාගමකින් වෙනස් වන ප්‍රධාන ආකාර **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) සීමිත පෞද්ගලික සමාගමක සීමා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) දිගුකාලීන බැංකු ණයක් ලබා ගැනීමෙන් මෙම ව්‍යාපාරයට ලබාගත හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

3. (i) (අ) 'සමාජීය ව්‍යවසායකත්වය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) සමාජීය ව්‍යවසායකත්වයේ අභියෝග **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ව්‍යවසායකයා සහ ව්‍යාපාරිකයා අතර ඇති වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ගනුදෙනුකරුවකු හට විද්‍යුත් ගෙවීම් ක්‍රම මගින් ලබාගත හැකි වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ (MSM) ව්‍යාපාර විශාල පරිමාණයේ ව්‍යාපාරවලින් වෙනස් වන ආකාර **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) 'උකස් ණය' සහ 'බැංකු අයිරාව' අතර ඇති වෙනස විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් ව්‍යාපාරිකයකුට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) චෙක්පත්වල පිළිපතෙහි සටහන් පවත්වාගෙන යාමේ පරමාර්ථ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) 'ක්ෂුද්‍ර මූල්‍යකරණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) ජීවිත රක්ෂණයේ ප්‍රතිලාභ හිමිවන පාර්ශ්ව **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) අපනයන ණය රක්ෂණය මගින් අපනයනකරුට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ව්‍යාපාර සංවිධානයකට සමාජ මාධ්‍යයේ ඇති වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සන්නිවේදනයේදී භාවිත කරනු ලබන සංඥා සහ සංකේතවල ඇති අවාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) 'නිර්බාධ වෙළෙඳාම' යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02 යි)

(ආ) උදාහරණයක් සහිතව 'බහුවිධ (Multi-modal) ප්‍රවාහනය' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) නියෝජිතයා සහ බෙදාහරින්නා අතර වෙනස්කම් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) තීරුබදු නොවන බාධකවලින් (NTB) තීරුබදු බාධක (TB) වෙනස් වන්නේ කෙසේ දැයි උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) නිෂ්පාදකයාට තොග වෙළෙඳාම වැදගත් වන්නේ ඇයි දැයි හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරිකයකු හට විද්‍යුත් වෙළෙඳාමෙන් අත්වන වාසි **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

[තුන්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

CamScanner

## II කොටස

5. කුටි නිෂ්පාදන පිරියත ක්‍රමය සහ ප්‍රතිචක්‍රීකරණය කරන ලද අමුද්‍රව්‍ය භාවිත කරමින් සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් රිද්මා විසින් ආරම්භ කර ඇත. ඇය විසින් විවිධ සේවක පෙළඹවීම් ක්‍රම භාවිත කරනු ලබන අතර තීරණ ගැනීමේදී සේවක සහභාගීත්වය ලබා ගනියි. එසේම, නිෂ්පාදන ක්‍රියාවලියේ ගැටලු ඇතිවීමට පෙර නිවැරදි කිරීමේ ක්‍රමවේදය ඇය විසින් අනුගමනය කරනු ලැබේ. ස්වයං විශ්වාසය, කර්මාන්තයේ විශේෂඥ දැනුම සහ සේවක සහයෝගීතාවය ඇයගේ කළමනාකරණයේ ලක්ෂණ වේ.

(i) (අ) රිද්මා සතු කළමනාකරණ කුසලතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) චර්යාත්මක පදනම අනුව, ඉහත සිද්ධිය ආශ්‍රයෙන් රිද්මාගේ නායකත්ව ශෛලිය කුමක් දැයි නම් කරන්න. ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) (අ) නිෂ්පාදන ක්‍රියාවලිය තුළ රිද්මා භාවිත කරන පාලන ශිල්පීය ක්‍රමය සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ළමයින් සඳහා නිෂ්පාදනය කරන සෙල්ලම් භාණ්ඩවල ගුණත්වය සහතික කිරීමට පැවතිය යුතු මූලිකාංග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) රිද්මාට යොදාගත හැකි මූල්‍යමය අභිප්‍රේරණ ක්‍රම **දෙකක්** සහ මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) යන්ත්‍ර ඵලදායිතාවය වැඩිදියුණු කිරීමට කර්මාන්තශාලාවක යොදාගත හැකි ක්‍රම **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී ප්‍රතිචක්‍රීකරණය කරන ලද අමුද්‍රව්‍ය භාවිත කිරීම මගින් රිද්මාට ලබාගත හැකි වාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'කුටි පිරියත' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) කුටි පිරියතෙහි ඇති වාසියක් හා අවාසියක් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

6. ABC ඔටෝ මොබයිල් (පෞද්ගලික) සමාගම ඉහළ සමාජ තත්ත්වයක් ඇති ධනවත් පුද්ගලයින් ඉලක්ක කරගෙන සුඛෝපභෝගී මෝටර් රථ නිෂ්පාදනය සහ අලෙවිය සිදු කරයි. මෙම සමාගම JIT තොග පාලන ක්‍රමය භාවිත කරන අතර නිෂ්පාදන ජීවන චක්‍රයේ වර්ධන අදියරේ ඇති නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පර්යේෂණ පවත්වනු ලැබේ. සමාගම ප්‍රධාන වශයෙන් මුහුණුපොත, යූ-ටියුබ්, ඉන්ස්ටග්‍රෑම් සහ ටික්ටොක් ප්‍රවර්ධන මාධ්‍ය ලෙස භාවිත කරනු ලබයි. සමාගම මෝටර් රථයක් රු. 10 000 000 කට අලෙවි කරන අතර විචල්‍ය පිරිවැය රු. 3 500 000 කි. ස්ථාවර පිරිවැය රු. 65 000 000 කි.

(i) (අ) 'JIT ක්‍රමය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) තොග පාලනය සඳහා JIT ක්‍රමය යොදා ගැනීමෙන් ඇතිවන වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'ඉලක්කගත වෙළෙඳපොළ' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සමාගමට වෙළෙඳපොළ පර්යේෂණ සිදු කිරීම වැදගත් වන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ඉහත සමාගම විසින් වෙළෙඳපොළ ඛණ්ඩනය සඳහා යොදාගෙන ඇති පදනම නම් කර, ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) වෙළෙඳපොළ ඛණ්ඩනය මගින් සමාගමට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) මුහුණුපොත, යූ-ටියුබ්, ඉන්ස්ටග්‍රෑම් සහ ටික්ටොක් අයත්වන වෙළෙඳපොළ ප්‍රවර්ධන ක්‍රමය නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදන ජීවන චක්‍රයක වර්ධන අදියරේදී දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(v) (අ) මෙම සමාගමේ සමච්ඡේදන ලක්ෂ්‍යය ඒකකවලින් හා රුපියල්වලින් කොපමණ ද? (ලකුණු 02 යි)

(ආ) සමාගම විසින් වාහන ඒකක 15 ක් අලෙවි කළේ නම්, ලාභය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

Visit EDUHUB
CamScanner

**7.** (i) (අ) 'ද්‍රවශීලතා අනුපාතය' නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක් සඳහා ද්‍රවශීලතා අනුපාතයෙහි ඇති ප්‍රතිලාභ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ව්‍යාපාරයක් සඳහා මූල්‍ය අයවැයක් සැකසීමෙන් ලැබෙන ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ 'අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(iii) (අ) සමාගමක් සඳහා සේවක අතිරික්තය බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) සමාගමක සේවක දුක්ගැනිවිලි හඳුනාගැනීමට භාවිත කළ හැකි ක්‍රම **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) සේවකයින්ට විරුද්ධව සේව්‍යයාට ගත හැකි විනය ක්‍රියාමාර්ග **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) සාමාජිකයකුට සේවක භාරකාර අරමුදලින් (ETF) ලබාගැනීමට හිමිකම් ඇති ප්‍රතිලාභ **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'කාර්යඵල ඇගයීම' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) 'කුසලතා ඉන්වෙන්ට්‍රියක්' (Skill inventory) පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරයකට අත්වන වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**8.** (i) (අ) දත්ත ඉදිරිපත් කළ හැකි ක්‍රම **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) හොඳ තොරතුරක ඇතුළත් ගුණාංග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) තොරතුරු තාක්ෂණය භාවිත කිරීමෙන් සංවිධානයකට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'ගොනු හුවමාරු ක්‍රියාවලිය' (File Transfer Protocol) යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) හිමිකාරීත්ව මෘදුකාංග (Proprietary software) හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග (Open-source software) අතර ඇති ප්‍රධාන වෙනස දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) 'පරිගණක වෛරසයක්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(iv) (අ) අලෙවි සැලසුමේ තරඟකාරී විශ්ලේෂණය තුළ ඉදිරිපත් කළ යුතු තොරතුරු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සංවිධානයකට ව්‍යාපාර සැලසුමක් අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'කාරක ප්‍රාග්ධනය' යනු කුමක් ද? එය ව්‍යාපාරයකට අත්‍යවශ්‍ය ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර සංරක්ෂණ බලපත්‍රයක් (EPL) ලබා ගැනීමෙන් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

Visit EDUHUB

CamScanner